| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.19 පැය 1150 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/90 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු**</u>

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මෝදර පොලිස් ස්ථානය.**

2025.01.18 වන දින රාත්‍රී කාලයේ මෝදර පොලිස් වසමේ බෝගහ හන්දිය ප්‍රදේශයේදී කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශය නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 500 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 52 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෝදර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**02. බඳින තුවක්කුවක් පත්තුවීමෙන් පුද්ගලයෙකු මියයාම- පොල්පිතිගම පොලිස් වසම.**

2025.01.18 වන දින උදෑසන කාලයේ පොල්පිතිගම පොලිස් වසමේ ඉරුදෙනියාව ප්‍රදේශයේදී බඳින තුවක්කුවක් පත්තුවීමෙන් තුවාල ලැබූ පුද්ගලයෙකු කුරුණෑගල රෝහලට ඇතුළත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා මහනුවර මහ රෝහල වෙත ඇතුළත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇති බවට පොල්පිතිගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයකට අනුව විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 42 ක් වන පොතුවිල, ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොල්පිතිගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**